## කවි කොළය ❊



**කොතරම් සමීපව සිටියත් දිනක සියල්ල දමා යන්නට සිදුවේ...**

## සත්‍යය දිහා ඇස් ඇර බලන්න !

උපත මෙන් මරණයද දුක වේ
පියන්ගෙන් වෙන්වීම දුක වේ
ජරා රෝ ඈ දුකින් සවිසත
පෙළෙත් දුකමයි සියළු පැත්තේ

දුකෙන් මිදුමේ මඟක් වේදැයි
සොයා ගිය මහ විදුදරාණෙනි
ඔබය දුටුවේ එමග නැණැසින්
වෙනත් කිසිවෙකු නොදක්නා ලද

මමය මාගේ කියන බලවත්
හැඟිමෙන් මිනිහා වෙලී ඇත
මමත්වය වේ දුකට හේතුව
මමත්වය වේ බියට හේතුව

මමය මාගේ කියන තණ්හා
කෙලෙස් මළ පිස දැමූ කල්හී
භයද ශෝකය පළා යනු ඇත
දුකින් මිදුමේ රහස එයවේ

උපත සමගින් සිත් උයන් හී
රෝපණය වූ කුඩා බීජය
වනස්පතියක් බවට පත්වී
තිබෙයි අක් මුල් විහිද තණ්හා

දමා අතු ඉති වැඩුණු මේ ගස
මුලින් උදුරා දමත හැකි යම්
කෙනෙක් වෙත් නම් ඒ තැනැත්තා
නිවන් දුටුවා යයි සිතන්නෙමි

නිවන යනු තව දෙව්ලොවක් යයි
සිතන පුහුලෝ නිවන් දක්නට
කරති දන් පින් පතා දිව සැප
පොහොර සපයති ගසට තණ්හා

මගේ දරුවා බිරිඳ නෑයා
මගේ වස්තුව සමග සිරුරද
අයිත් නැත මට සිතා මේ ලෙස
බැඳුම් බිඳහළ කෙනෙහි ආශා
පලා යනු ඇත දුකද භීතිය

මහණ දම් පිරුවෙකුට මිස එය
ගිහිව සිටිනා අපට කළැකිද
රහත්බව ලත් කිසිම ගිහියෙකු
නුදුටුවෙමි පත පොතක කිසිදා

♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**





**❊❊❊❊ 1952 ❊❊❊❊❊❊❊❊❊❊ 2012 ❊❊❊❊**

# දියමන්ති (වජ්‍ර) ජයන්ති සැමරුම
# Diamond Jubilee celebration

The River Thames became a royal highway Sunday, the June 3rd, as Queen Elizabeth II led a motley but majestic flotilla of more than 1,000 vessels in a waterborne pageant to mark her Diamond Jubilee. In a colorful salute to Britain's maritime past, an armada of skiffs and sailboats, rowboats and paddle steamers joined a flower-festooned royal barge down a 7-mile stretch of London's river.

With a crowd of rain-soaked spectators estimated by organizers at 1.25 million cheering from the riverbanks, the pageant was the largest public event in four days of celebrations of the monarch's 60 years on the throne. On Monday, the queen joined thousands of revelers at an outdoor concert beside Buckingham Palace, headlined by pop royalty including Paul McCartney and Elton John.

More than one million people gathered in Central London as the Queen made her final public appearance of the diamond jubilee celebrations.

Euphoric well-wishers many who camped out overnight to secure a prime vantage spot cheered and sang the national anthem as the monarch appeared on the balcony of Buckingham Palace.

At least 2,50,000 people packed into the Mall to witness the moment while 40000 people were in Hyde Park alone. Crowds on the Mall were led up to the gates of the Buckingham Palace flooding the whole area with a sea of flag-waving supporters.

The Queen thanked all saying that she was deeply touched and extremely humbled by the public response shown on her diamond jubilee celebrations.

**දෙ**වන එළිසබෙත් මහ රැජිණගේ කිරුළ පැළඳීමේ දියමන්ති ජයන්ති උත්සවය දින තුනක් තිස්සේ අතිශය අලංකාර අන්දමින් පැවතී ගෙවී ගියේය. ජුනි 3 වන ඉරිදා ලන්ඩනයේ තේම්ස් ගංගාවේ රැජිණ ඇතුළු රාජකීයයන් රැගත් විභූෂිතව සැරසූ බෝට්ටුව පෙරමුණ ගනිමින් තවත් යාත්‍රා දහසකට ආසන්න ගණනක් නදියේ පැද ගියේය. එය ඉන් පෙර කිසිදාක ලන්ඩනයේ නොපැවති අන්දමේ විශේෂ උත්සවයක් බව කවුරුත් කියති.

පසුදා සවස බකිංහැම් මාලිගය අබියස භූමියේ තනන ලද වේදිකාවේ අද ලොව විශිෂ්ට ගණයේ ගායක වාදක නාටක ශිල්පීන්ගේ අතිශය අලංකෘත ප්‍රසංගයක් පැවැත්වුණි. එය නරඹන්නට පැමිණි පිරිස මිල්යනයට අධිකය. බැලූ බැලූ අත දක්නට වූයේ හිස් ගොඩවල්ය. මේ සියල්ල දකිමින් මහ රැජිණගේ මුහුණ නිරන්තරයෙන් එදා අලෝකමත්ව තිබූ සැටි එංගලන්තයේ පමණක් නොව ලොව පුරා එය නැරඹූ කවුරුත් පසක් කරගන්නට ඇතුවා නිසැකය.

අවසන රැජිණ හෘදයාංගමව මෙසේ කීවා ය. “ ඔබ කාටත් ස්තුතියි ! මේසා දෙයක් මා බලාපොරොත්තු වුණේ නෑ. ඔබට අනේකවාරයක් ස්තුතියි ! ”

## දියමන්ති ජුබිලියට ශ්‍රීලංකාවෙන් රාජකීය තේ කෝප්පයක්!

**ම**හා බ්‍රිතාන්‍යයේ දෙවන එළසබෙත් රැජිණගේ දියමන්ති ජුබිලි උත්සවයේදී ලෝක ප්‍රසිද්ධ ශ්‍රීලංකා තේ කෝප්පයට විශේෂ තැනක් ලැබීම අපට ආඩම්බරවිය හැකි කරුණක් නොවන්නේද? ඔව් ! ඇත්තෙන්ම එය ආඩම්බර විය යුතු උදාර අවස්ථාවකි. මෙම රාජකීය තේ කෝප්පය පිළියෙල වන්නේ මෙසේය.

1954 වර්ෂයේදී එළිසබෙත් මහ රැජිණ තම සැමියාවූ එඩින්බරෝ ආදිපාදයන් සමග ශ්‍රීලංකාවේ සංචාරයක යෙදුනාය. එම ගමන සිහිපත්වීම සඳහා සිරිත් පරිදි එඩින්බරෝ ඇපාණන් විසින් රෝපණය කරනු ලැබ ඇත්තේ තේ පැළයකි. මෙය කුමන ප්‍රදේශයේ දැයි දැනට අප නොදන්නා මුත් මෙය කියවන කාට හෝ එය සොයා ගැන්ම අපහසු නොවේ යයි සිතමු.

ඉංග්‍රීසීන් අප රට යටත් කරගැන්මටත් පෙර සිට ක්‍රියාත්මකව තිබූ පෙර දිග වෙළඳ සමාගම හෙවත් දි්එ ෂබාස් කදපච්බහ ය ගැන ඔබ අසා ඇතැයි සිතමි. මෙය වර්තමානයේද බ්‍රිතාන්‍යයේ ක්‍රියාත්මක වන සමාගමකි. මෙම තේ කෝප්පය පිළියෙළ කරවන කාර්‍යය කර ඇත්තේ එම සමාගමයි.

එඩින්බරෝ ආදිපාදයන් විසින් එදා සිටුවන ලද තේ පඳුරෙන් ලබාගත් තේවලින් තේ කෝප්ප 250 ක් පමණ සීමිත ප්‍රමාණයක් සාදා ඇතියි එම සමාගම ප්‍රකාශකරයි ඉන් අංක 1 නැතහොත් පළමු වැන්න එඩින්බරෝ ආදිපාදයන්ටම පිළිගන්වා ඇති බව කියති. මෙම තේ ග්‍රෑම් 60 ක් බ්‍රිතාන්‍ය පවුම් 75 ක් නැතහොත් ලංකා රුපියල් 15,000 කට මිළකර ඇත.

මෙම ප්‍රවෘත්තිය ශ්‍රීලංකා තේ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගත හැකි ප්‍රබල සිද්ධියක් වන අතර අදාළ ආයතන මෙයින් උපරිම ප්‍රයෝජන ගනු ඇතියි අපේක්ෂා කරමු.

♦ **එම්. බී. පුස්සේගොඩ**
**London NW2**




**ඉරිදා- SUN** කොළඹ අපේ කටුගේ හෙවත් කෞතුකාගාරය ගිය සතියෙ හොරු කඩලා, ඒකෙ තිබුණු වටිනා භාණ්ඩ, කාසි වර්ග, පුරාණ රජකාලෙ රන් රිදී ආභරණ, කඩු, හෙල්ල, රත්තරන් පිළිමයක්, මේ ආදී දේවල් අරන් ගිහිං මුරකාරයො, ඒ කියන්නෙ සිකියුරිටි කාරයො හොඳට නිදාගෙන ඉඳලා තියනවා, මේ දවස්වල රස්නෙ හින්දා ජනෙල් සේරම ඇරගෙන. හොරු නිදාගෙන හිටි සික්කන්ගෙ ඇඟට උඩින් පැනලා ගිහිල්ලා කිසි අමාරුවක් නැතුව කටුගේ බාගෙයක් සුද්දකරගෙන ගිහිං. කටුගේ ලොක්කො දැන් පල් එක හන්දා කියනවලු “ අපි මීට පස්සෙ හොඳට සිකුයුරිටි දානවා....ආයි කිසිම හොරෙකුට තියා මැස්සෙකුට ඇතුල්වෙන්න බැරිවෙන්න” කියලා. දැන් ඉතින් කොහොමත් ඒකෙ ගෙනියන්න දෙයක් නෑ.

**සඳුදා- MON** මහ රැජිණගෙ දියමන්ති ජුබිලි චාරිකාව බලන්න අපි වෙල්සි පාලම උඩට ගියා. නන්දනීලත් එතෙන්දි හම්බවුණා. ඒ වැස්සෙත් මිනිස්සු තෙමි තෙමී වුනත් හරි සතුටකින් රැජිණට ප්‍රීති ඝෝෂා කළේ. ඒ පාළම උඩ දාහකට වැඩි සෙනග මට බයහිතුණා පාලම කඩාගෙන වැටේද කියලත්. තේම්ස් ගඟේ හෙණ හුළං පාර. රැජිණ රෙද්දක් පෙරවගෙන හිටියේ. අපිත් පාළම උඩ හිටියෙ ගැහි ගැහී. කිසි කෙනෙක් රැජිණට දොස් කියනවා මම තවම අහලා නැහැ. රජ පවුලෙ අනික් අයට ඉඳලා හිටලා හිටලා මොනව හරි කිව්වත් රැජිණට වචනයක් වත් කියන්න කිසි කෙනෙකුට හිතෙන්නෙ නැහැ. ලස්සනයි හැඩයි විශේෂයෙන් ගැහැණු අයගෙ එන්නෙ කරුණාව නිහතමානිකමත් එක්කයි. ඒ හැමදේම රැජිණට තියනව කියලා පේනවා. වාසනාවන්ත ලස්සන කාන්තාවක් !

**කුජදා - TUE** ලංකාවෙ ප්‍රයිවට් ඉස්පිරිතාලවලට ගියාම එළියට එන්නෙ හිඟන්නො වෙලයි කියලා කැතරින් කුඩම්මා ලියලා එවලා තියනවා. ලෙස්ලි බාප්පට මුත්‍රා අමාරුවක් හැදිලා කොළඹ ප්‍රයිවට් රෝහලක දොස්තර කෙනෙක් චැනල් කරලා තියනවා. බලපු දොස්තර කිව්වලු වැඩේ හිතුවට වඩා සීරියස් මුත්‍ර බොක්කෙ ගලක් තියනවා. හම්බන්තොට වරායෙ තිබුණු ගලටත් වැඩිය විසාල. ඩයින මයිට් දාලවත් කඩන්න බැරිතරම්. වහාම ඔපරේෂන් එකක් කරන්න වෙනවා. අදම වාට්ටුවට ඇතුල් වෙන්න කියලා. කුඩම්මා නිකමට අහලා ගණන කීයක් වේද කියලා. කිව්වලු වැඩිය නැහැ රුපියල් හැටපන්දාහක් විතර වේවි කියලා. මගෙ අම්මෝ අපි යං කියලා බාප්ප කිව්වලු. එතකොට අර ගලට මොකද කරන්නෙ? කියලා දොස්තර ඇහුවලු. මහත්තෙයො මං ඒක අපේ තාප්පෙ බැන්ද මේසන් බාස් උන්නැහෙට කියලා අරන් දම්ම ගන්නම් කියලා ඇවිල්ලා. දැන් බාප්ප මතුගම සිංහළ වෙදමහත්තෙයෙකුගෙන් කසාය බොනවයි කිව්වා.

**බුදදා - WED** මේ ළඟදි ලංකා ආණ්ඩුවෙ සමාජ සේවා ඇමති පීලික්ස් පෙරේරා පාර්ලිමේන්තුවෙ යෝජනාවක් ගෙනැල්ලා හැම ගමකම මත්පැන් බාර් එකක් අරින්න. ගමේ මිනිස්සුන්ට එතකොට ඈහේ මහන්සිය යන්න පොඩි අරක්කු ෂොට් එකක් දාගන්න පුළුවන් කියලා. පොඩි ෂොට් එකෙන් පටන් අරගෙන දවසකට බෝතලයක් දක්වා ගිහිං ගම්වල පිරිමි අකාලයේ වලපල්ලට යන බව ගොන් පීලික්ස් පෙරේරා දන්නෙ නැතුවද? ජනාධිපතිම රටේ බේබදුකම නවත්තන්න ගෙනාපු මතට තිත කියන ව්‍යාපාරෙකුත් තියනවා නේද? එහෙනම් මේ ඇමතියා මොනවද මේ කියන්නෙ? ලංකාව දියුණු කරන්න හිතාගෙන ඉන්නෙ හැමගමකම බාර් ඇරලද? ධර්මපාල තුමා මේ වගේ අමනයන්ට එදා පාවිච්චි කළේ ගොන් තඩියා කියන වචනෙ. ඒක දැනුත් හරියට හරි!

**ගුරුදා - THU** ජනාධිපති මහින්ද රාජපක්ෂ මහ රැජිණගෙ දියමන්ති ජුබිලියට ආරාධනා ලැබිලා ලන්ඩනයට ආපු දවසෙ ඉඳලා යන කල්ම මෙහේ ඉන්න දෙමළ ඩයස්පෝරාවෙ කොටි ඊළම් කොඩි වන වන උද්ඝෝෂණය කළා. උන් ජනාධිපතිගෙ පඹයෙකුත් හදලා පිච්චුවා. බ්‍රිතාන්‍යයේ සමහර පත්තර වල ඒක පෙන්නලා තිබුණෙ ලංකා ජනාධිපතිට වුණු පල් එකක් සවුත්තුවක් හැටියට. මට නම් පේන්නෙ ඒ පල් එක මහින්දට නෙවෙයි. මහ රැජිණට යි බ්‍රිතාන්‍ය ආණ්ඩුවටයි. ආරාධනාවක් ලැබිලා තමන්ගෙ රටට ආපු රාජ්‍ය නායකයෙකුට ලෝකෙම තහනම් කරපු ත්‍රස්තවාදි කල්ලියක කොඩිවනලා දක්වපු අවනම්බුවට. අගමැති කැමරන් ලැජ්ජා වෙන්න ඕන.

**කිවිදා - FRI** අද ලංකාවෙ ප්‍රවෘත්ති සිරස්තලයක මම දැක්කා කොළඹ විශ්ව විද්‍යාලෙට අළුතෙන් ඇතුල් වුණු ගෑණු ළමයි තුන් දෙනෙක්ව නවක වධය දෙනවා කියලා කරුවල කාමරයකට අරන් ගිහින් පිරිමි ශිෂ්‍යයො ලිංගික අතවර කරලා. මෙන්න අද ලංකාවෙ සිංහළ සමාජයෙ හැටි. මෙන්න අධ්‍යාපනයෙ හැටි. මේවා නවත්වන්න බැරි රජයක් ලංකාවට මොකටද? කෝ නීතිරීති.? කෝ අධ්‍යාපන ඇමතියෙක් ඒ රටේ නැද්ද? ලෝකෙ කිසිම රටක විශ්ව විද්‍යාලෙක මේ වගේ බලු වැඩ වෙනවද? විශ්ව විද්‍යාලයක් කියන්නෙ රටක උසස්ම ආයතනයක්. උගතුන් ලොවට බිහිකරන තැනක්. ඒක මරදානෙ මරියකඩේ පැත්තෙ තියන මුඩුක්කුවක් ගුබ්බෑයමක් නෙවෙයි.